රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No. SA/SD/08/01/04 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2014.01. 27

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක :- 237/2014

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානින් සහ

දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

මහත්මයාණෙනි/මහත්මියණි,

<u>වැටුප් මෘදුකාංගය හා සම්බන්ධ දත්ත රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගැනීම.</u>

මහ භාණ්ඩාගාරය විසින් රාජ්‍ය සේවක වැටුප් ගෙවීම සඳහා 2014 වර්ෂය වෙනුවෙන් රු.බිලියන 411ක් වෙන් කර ඇත, එම වියදම 2014 පුනරාවර්තන වියදමෙන් 31% පමණ ප්‍රතිශතයක් වන බැවින්, සහ සේවා නියුක්තිකයන්ගේ එක් එක් තනතුරු අනුව සංඛ්‍යාව, වැටුප් හා වේතන ගෙවීම් පිළිබඳව දත්ත ලබාගැනීම සඳහා සියළුම රාජ්‍ය ආයතන වල වැටුප් විස්තර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ගෙන්වා සමාලෝචනය කිරීමට තීරණය කර ඇත.

02. දැනට ක්‍රියාත්මක වන Payroll, DOS වැඩසටහනෙහි දත්ත ඇතුලත් කිරීමේ දී, අදාල නිලධාරියාගේ ජාතික හැඳුනුම්පත් අංකය (NIC No), තනතුර (Designation), සේවය (Service) සහ කාණ්ඩය (Category) 2014 ජනවාරි සිට Payroll වැඩසටහනට ඇතුලත් කිරීම අනිවාර්ය වේ. ඉහත සඳහන් දත්ත ඇතුලත් කරනු ලැබූ Payroll විස්තරය ඒ ඒ ආයතනය විසින් අදාල වියදම් ශීර්ෂය භාර ප්‍රධාන ගණකාධිකාරිවරයා මඟින් pyrempma.dbf (Employee Master File) හා pymroll.dbf (Payment File)යන ගොනු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත විද්‍යුත් තැපැල මඟින් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර එවිය යුතුය.

03. ඔබ ආයතනය Payroll, Windows වැඩසටහන භාවිතා කරන්නේ නම් එහි Utilities යටතේ Email to Treasury යන Option එක Click කිරීමෙන් මෙම File දෙක GPSWIN Folder හි Email නම් වූ Folder එකට Save වේ. එම Zip File දෙක (emp.rar හා pay.rar)රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත දෙවන ඡේදයේ සඳහන් ආකාරයට විද්‍යුත් තැපැල මඟින් එවිය යුතු වේ.

04. එසේ එවන විද්‍යුත් ලිපියෙහි මාතෘකාව ලෙස අදාල ආයතනයෙහි ගිණුම් ශීර්ෂය දැක්වීම අනිවාර්ය වේ.

විද්‍යුත් තැපැල : payroll@sad.treasury.gov.lk

05. උපකාර්යාල පවතින ආයතන විසින් අදාල මාසයේ සියළු උපකාර්යාලයන්හී දත්ත, ප්‍රධාන කාර්යාලයේ දත්ත සමඟ එකතු කර එවිය යුතු අතර එසේ ඉලෙක්ට්‍රොනික වශයෙන් එකතු කිරීමට අපහසු ආයතන වේ නම් ඉහත සඳහන් පරිදි අදාල ගොනු උපකාර්යාල වෙතින් ගෙන්වා ගෙන එසේ ගෙන්වා ගත් සියළු ගොනු ඉහත උපදෙස් වලට අනුකූලව ඉදිරිපත් කළ යුතුය.

06. 2012.05.31 දින නිකුත් කරන ලද රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 223/2012 මින් අවලංගු කරමි.

07. මේ පිළිබඳ විමසීමක් කිරීමට අවශ්‍ය වන්නේ නම් නොපමාව මෙම දෙපාර්තමේන්තුවේ, පද්ධති සංවර්ධන, පුහුණු හා අත්තිකාරම් ගිණුම් අංශයේ අධ්‍යක්ෂ බී.ඒ.ටී රුදිගු මහතා දු.ක. 011-2484735 , සහකාර අධ්‍යක්ෂ එස්.තර්ශන් මහතා දු.ක. 011-2484826 හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි ආර්. වටගොඩ මහතා දු.ක.011-2484881 විමසීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට - විශ්වාසී

එන්.ජී.දයාරත්න
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ( දැන ගැනීම පිණිස )